**අංක. 02.]**

(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2010 මැයි මස 04 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, මෙතැන් පටන් රැස්වීම් පැවැත්වෙන කාල වේලා අඟහරුවාදා, බදාදා සහ බ්‍රහස්පතින්දා දිනවල පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වාද, අ.භා. 1.00 සිට අ.භා. 4.30 දක්වා ද, සිකුරාදා දිනවල පූ.භා. 9.30 සිට අ.භා. 1.00 දක්වා ද විය යුතු ය. අඟහරුවාදා, බදාදා සහ බ්‍රහස්පතින්දා දිනවල අ.භා. 3.30 ට ද, සිකුරාදා දිනවල මධ්‍යාහ්න 12.00 ට ද, ස්ථාවර නියෝග 7 හි (5) ඡේදය ක්‍රියාත්මක විය යුතු ය. අඟහරුවාදා, බදාදා සහ බ්‍රහස්පතින්දා දිනවල අ.භා. 4.30 ට ද සිකුරාදා දිනවල අ.භා. 1.00 ට ද කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතුය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— තේරීම් කාරක සභාව (අංක 1),— ස්ථාවර නියෝග අංක 121 අනුව පවත්නා සැසි වාරයේ සේවය සඳහා වූ තේරීම් කාරක සභාව කථානායකතුමාගේ සභාපතිත්වයෙන් සහ දේශපාලන පක්ෂවල නායකයින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් වන පාර්ලිමේන්තුව විසින් නම් කරන ලද සාමාජිකයින් දහ හත් දෙනෙකුගෙන් (17) සමන්විත විය යුතුය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— තේරීම් කාරක සභාව (අංක 2),— අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාර, මෙම කාරක සභාවේ සභාපති වන ගරු කථානායකතුමාට අතිරේකව, පහත නම් සඳහන් මන්ත්‍රීන් දහ හත් දෙනා (17) පවත්නා සැසිවාරය තුළදී තේරීම් කාරක සභාවේ සේවය කළ යුතුය.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු ඩිව් ගුණසේකර මහතා
ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා
ගරු විමල් වීරවංශ මහතා
ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
ගරු ජෝන් අමරතුංග මහතා
ගරු කරු ජයසූරිය මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු සුරේෂ් ක. ප්‍රේමචන්ද්‍රන් මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
ගරු රවුෆ් හකීම් මහතා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද, සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2010 මැයි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**